# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,102 - 2018 දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජනවාරි මස 04 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 දෙසැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය

බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව

**පුහුණු පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2019**

බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවතින බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන දැව තාක්ෂණ, ලුහු ඉංජිනේරු, විද්‍යුත් තාක්ෂණ, පරිගණක, මැහුම්, පේෂ කර්මාන්ත, මැණික් කැපීම හා ඔප දැමීම, සම්/මැටි/කොහු කර්මාන්ත යන පුහුණු පාඨමාලා (සිංහල මාධ්‍ය සඳහා) 2019 වර්ෂයට ආධුනිකයන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අතර, ඒ සඳහා උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි පාසල් හැරගිය සහ පාසල් අධ්‍යාපනය අවසන් කළ තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*පූර්ණ කාලීන පාඨමාලා :*

| *අනු. අංකය* | *පාඨමාලා අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පැවැත්වෙන දිස්ත්‍රික්ක* | *පුහුණු මධ්‍යස්ථානය* |
|---|---|---|---|---|---|
| 01 | 001 | **ලුහු ඉංජිනේරු පුහුණු පාඨමාලාව**<br>• වෙල්ඩින් ශිල්පය<br>• ලියවන පට්ටල් වැඩ<br>• වායු හා විදුලි පෑස්සුම් වැඩ<br>• කම්මල් වැඩ<br>• ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම<br>• විෂයානුබද්ධ ඉංග්‍රීසි | වසර 01 | කොළඹ<br>ගම්පහ<br>කළුතර | අවිස්සාවේල්ල, කිරිදිවැල, වැබඩ, රදාවඩුන්න, නාගොඩ, අගලවත්ත |
| 02 | 002 | **දැව තාක්ෂණ පුහුණු පාඨමාලාව**<br>• වඩු සටහන් ඇඳීම<br>• වඩු අත් ආයුධ/යන්ත්‍ර හඳුනා ගැනීම<br>• ලී වැඩ තාක්ෂණය<br>• වෘත්තීය ගණිතය | වසර 01 | කොළඹ<br>ගම්පහ<br>කළුතර | දූල්තර, වැලිකන්න, මීගමුව, පල්ලියපිටිය, වේයන්ගොඩ, කඳුබොඩ, කඳන්ගමුව, අගලවත්ත, වලාන, මස්විල |
| 03 | 003 | **මැහුම් පුහුණු පාඨමාලාව**<br>• මූලික මැහුම් ක්‍රම<br>• ඇඳුම් කැපීම හා මැසීම (ටේලරින්)<br>• බෑග් මැසීම<br>• පැච්වර්ක්<br>• තිර රෙදි මැසීම<br>• එම්බ්‍රොයිඩර් හා ගෙතුම්<br>• රෙදි පින්තාරු | වසර 01 | කොළඹ<br>ගම්පහ<br>කළුතර | කිරුළපන, අත්තිඩිය, මීගමුව, මහර, අකරංගහ, දෙදියවල, අගලවත්ත, වාද්දුව |
| 04 | 004 | **පරිගණක මෘදුකාංග හා දෘඩාංග පුහුණු පාඨමාලාව**<br>• MS Office<br>• Graphic Designing<br>• Web Designing<br>• Computer Hardware<br>• Computer Networking<br>• Computer Programming | මාස 06 | කොළඹ<br>ගම්පහ<br>කළුතර | එන්සෙෆ් මුල්ලේරියාව, පුහාඹුගොඩ, මහර |

| අනු. අංකය | පාඨමාලා අංකය | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාලසීමාව | පැවැත්වෙන දිස්ත්‍රික්ක | පුහුණු මධ්‍යස්ථානය |
|---|---|---|---|---|---|
| 05 | 005 | **විද්‍යුත් තාක්ෂණ පුහුණු පාඨමාලාව**<br>• මූලික විද්‍යුත් තාක්ෂණය<br>• සරල ධාරා සහ ප්‍රත්‍යාවර්තන ධාරා<br>• ගුවන්විදුලි සහ රූපවාහිනී තාක්ෂණය<br>• විෂයානුබද්ධ ඉංග්‍රීසි | මාස 06 | ගම්පහ<br>කළුතර | කිරිඳිවැල, වේයන්ගොඩ, රදාවඩුන්න, දළදාවත්ත |
| 06 | 006 | විසිතුරු මැටි භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලාව | මාස 06 | ගම්පහ<br>කළුතර | බියගම, කළුකොදයාව, සමෘද්ධිගම, දෙදියවල, මහයාල |
| 07 | 007 | කොහු කර්මාන්ත නිෂ්පාදන පුහුණු පාඨමාලාව | මාස 06 | ගම්පහ<br>කළුතර | විගොඩ, පල්ලේගම, උඟුරුවල, කළුවාමෝදර |
| 08 | 008 | පේෂ කර්මාන්ත නිෂ්පාදන පුහුණු පාඨමාලාව | මාස 06 | කොළඹ<br>ගම්පහ<br>කළුතර | දිස්ත්‍රික්ක 03හි පිහිටා ඇති සියලුම පේෂකර්ම පුහුණු මධ්‍යස්ථාන |
| 09 | 009 | මැණික් කැපීම හා ඔප දැමීම පුහුණු පාඨමාලාව | මාස 06 | කළුතර | අගලවත්ත |
| 10 | 010 | සම් කර්මාන්ත පුහුණු පාඨමාලාව | මාස 06 | කොළඹ | හංවැල්ල |
| | | සම් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදන පුහුණු පාඨමාලාව | | කොළඹ | දූල්තර |

- පුහුණු පාඨමාලා සාර්ථකව නිමකරන ලද පුහුණුලාභීන් සඳහා වෘත්තීය පුහුණුවට සම්බන්ධ රජයේ පිළිගත් සහතිකයක් ලබා දෙනු ලැබේ.

- පූර්ණ කාලීන පුහුණු පාඨමාලා සඳහා පුහුණු කාලය තුළ රු. 250.00 ක දෛනික පැමිණීමේ දීමනාවක් ගෙවනු ලැබේ.

*කෙටි කාලීන පාඨමාලා* : (වයස් භේදයකින් තොරව බඳවා ගැනේ.)

| පුහුණු පාඨමාලාව | පාඨමාලා කාලය | දිස්ත්‍රික්කය | පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ආරම්භය |
|---|---|---|---|---|
| ජංගම දුරකථන අළුත්වැඩියා කිරීමේ පුහුණු පාඨමාලාව | පැය 100 | කළුතර | වාද්දුව දළදාවත්ත විද්‍යුත් තාක්ෂණ මධ්‍යස්ථානය | අයදුම්පත් සංඛ්‍යාව මත, කණ්ඩායම් වශයෙන් ආරම්භ කරනු ලැබේ. |
| ජලනල කාර්මික පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ | එන්සෙෆ් මුල්ලේරියාව | |
| විද්‍යුත් තාක්ෂණ පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ | එන්සෙෆ් මුල්ලේරියාව | |
| රූපලාවන්‍ය පාඨමාලාව | පැය 100 | කොළඹ | එන්සෙෆ් මුල්ලේරියාව | |
| මැහුම් පුහුණු පාඨමාලාව - ටේලරින් | මාස 06 | ගම්පහ<br>කොළඹ | මීගමුව මැහුම් පුහුණු මධ්‍යස්ථානය<br>අත්තිඩිය මැහුම් පුහුණු මධ්‍යස්ථානය | |

| පුහුණු පාඨමාලාව | පාඨමාලා කාලය | දිස්ත්‍රික්කය | පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ආරම්භය |
|---|---|---|---|---|
| රෙදි බෑග් මැසීමේ පුහුණු පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | අයදුම්පත් සංඛ්‍යාව මත, කණ්ඩායම් වශයෙන් ආරම්භ කරනු ලැබේ. |
| සාරි වැඩ දැමීමේ පුහුණු පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |
| රෙදි පින්තාරු පුහුණු පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |
| රූපලාවන්‍ය පුහුණු පාඨමාලාව | පැය 100 | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |
| තිර රෙදි මැසීමේ පුහුණු පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |
| විසිතුරු ආභරණ සැකසීමේ පුහුණු පාඨමාලාව | පැය 100 | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |
| පැච්වර්ක් පාඨමාලාව | මාස 03 (සතියකට එක් දිනක්) | කොළඹ ගම්පහ කළුතර | ඉල්ලීම මත ස්ථානය තීරණය වේ. | |

*පාඨමාලා සඳහා අයදුම් කිරීම. :*

* ඔබ විසින්ම සකස් කරගත් අයදුම්පත, නම, ලිපිනය, දුරකථන අංකය, හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාව, අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව 2019.01.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

* අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවර ඔබ විසින් අයදුම් කරන පාඨමාලාවේ නම සඳහන් කළ යුතු ය.

*අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :*

අධ්‍යක්ෂ,
කර්මාන්ත දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත),
අංක 204, පළාත් සභා ගොඩනැගිල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

දුරකථන : 011-2092596/011-2092593
ෆැක්ස් : 011-2092562
විද්‍යුත් තැපෑල : doindwp@gmail.com

12-489

## මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ පවතින ගිනිහට නිලධාරි තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම - 2018

මධ්‍යම පළාතේ පහත සඳහන් මහ නගර සභා වල ගිනි නිවීමේ ඒකකයන්හි පවතින ගිනිහට නිලධාරි තනතුරු පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

(i) මහනුවර මහ නගර සභාව
(ii) මාතලේ මහ නගර සභාව
(iii) නුවරඑළිය මහ නගර සභාව
(iv) දඹුල්ල මහ නගර සභාව

02. මෙම තනතුර ස්ථිරය/රජය විසින් දනුම්දෙනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතු ය.

03. *වැටුප් පරිමාණය.-* රා. ප. ච. 03/2016, Rs. 1-2016. වැටුප් ගෙවීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන අංක II හි සඳහන් පරිදි වැටුප් ගෙවීම් සිදු කරනු ඇත.

*වැටුප් පරිමාණය.-* රු. 29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630 (04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගයකින් සමත් විය යුතු ය.)

04. *වයස් සීමාව.-* අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 25 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

05. *මූලික සුදුසුකම්:-*

5.1 *අධ්‍යාපන සුදුසුකම් :-*

අ.පො.ස. (සා. පෙ.) විභාගයෙන් අඩු වශයෙන් වාර දෙකකදී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුලු විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවකදී සමත් විය යුතු ය.

5.2 *වෙනත් සුදුසුකම් :-*

(i) *(අ)* විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, ඔවුන්,

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
(ii) මධ්‍යම පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 3 ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(iii) අඩි 5 අඟල් 4 ක අවම උසකින් යුක්ත විය යුතු ය.
(iv) කිලෝ ග්‍රෑම් 56 ක අවම බරකින් යුක්ත විය යුතු ය.
(v) පපුව අඟල් 32 ට (ප්‍රසාරණය කළ විට) නොඅඩු විය යුතු ය.
(vi) අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය.
(vii) බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතු ය.

*(ආ)* ගිනි නිවීමේ පුහුණුව පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*සටහන.-* ඉහත සුදුසුකම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේ දී ඔබ විසින් සනාථ කළ යුතු ය.

5.3 *කායික හා මානසික යෝග්‍යතාවය.-* සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයක් පවතින බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

(i) පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත්‍ර කැඳවා ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අයගෙන්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණයකට සුදුසුකම් ලබන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහළම සුදුසුකම් ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කෙරේ.

*බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය.-*

*(අ)* සාමාන්‍ය දැනීම හා බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා ලකුණු 100 ක් වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය. ලකුණු 40 ට වැඩියෙන් ලබා ගන්නා අපේක්ෂකයින් සමත් ලෙස සැලකේ.

| | |
|---|---|
| සාමාන්‍ය දැනීම | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම |
| බුද්ධිය පරීක්ෂා කිරීම | අපේක්ෂකයින්ගේ තර්කානුකූල ශක්තිය විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාව, ඉක්මනින් හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව මැනීම |

*ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය.-*

*(ආ)* ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පහත කරුණු සලකා බැලේ.

| *ඉසව්ව* | *හැකියාව මැනීමේ ක්‍රමවේදය* |
|---|---|
| මීටර් 800 ධාවනයේ යෙදීම | කාලය ගණනය කිරීම |
| මීටර් 100 ධාවනයේ යෙදීම | කාලය ගණනය කිරීම |
| Shuttle Run | කාලය ගණනය කිරීම |
| Sit up exercisers | විනාඩි 02 ක කාලය තුළ උපරිමය |
| Dips | විනාඩි 02 ක කාලය තුළ උපරිමය |
| කඹයක ආධාරයෙන් මීටර් 15 ඉහළට නැගීම හා බැසීම | කාලය ගණනය කිරීම (කඹයේ නැගීමේ හා බැසීමේ තාක්ෂණ ක්‍රමවේදය අනුව) |
| අඩි 60-100 ප්‍රමාණයේ ඉනිමග නැගීම හා බැසීම | කාලය ගණනය කිරීම |
| Drop Stick | ප්‍රතිචාර දැක්වීම |

ශාරීරික යෝග්‍යතාව මැන බැලීමේ පරීක්ෂණයේ දී අයදුම්කරුට සිදු වන යම් තුවාලවීම් හෝ ආපදාවන් සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටින අතර ඒ බවට ලිඛිත පොරොන්දුවක් මෙකී පරීක්ෂණයට පෙර ලබා දිය යුතු ය.

(ii) *සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ.-*

පළාත් පාලන කොමසාරිස් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පැවැත්වේ.

07. *අනෙකුත් සේවා කොන්දේසි.-*

තෝරා ගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු ය. පුහුණු කාලසීමාව තුළදී වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත ප්‍රගති මට්ටමට ළඟා විය නොහැකි වන පුහුණුකරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කිරීම පත්වීම් බලධාරියාට කළ හැකිය.

පුහුණු කාලසීමාව තුළදී රු. 15,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

පුහුණුව සාර්ථකව නිම කරනු ලබන අභ්‍යාසලාභීන් මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ගිනිහට තනතුරට අදාළ වැටුප් තලය මත පත් කරනු ලැබේ.

පුහුණුව සඳහා ඇතුළත් වන අවස්ථාවේ දී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05 ක කාලසීමාවක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 100,000 ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතු ය.

පුහුණුව ආරම්භ කිරීමට පෙර සියළුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

ගිනිභටයන් වශයෙන් පත්වීම් ලැබූ විට එම පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ පදිංචිවීම අනිවාර්යය වේ.

පුහුණු කාල සීමාව තුළදී පුහුණුකරුගේ යම් දුර්වලතාවන් නොසැලකිල්ලක් හෝ අනවධානය හෝ වෙනත් යම් හේතුවක් මත හෝ සිදුවන ශාරීරික ආබාධ සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතනය වගකීමට බැඳී නොසිටී.

8. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

(i) නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශයට අනුව A4 (සෙ. මී. 21 x සෙ. මී. 29) ප්‍රමාණයේ කඩදාසි ප්‍රයෝජනයට ගනිමින් අයදුම් පත්‍රය සකස් කළ යුතු ය. (පළමු පිටුව අංක 01 සිට 06 දක්වාත්, දෙවන පිටුව 07 සිට 15 දක්වාත්, තෙවන පිටුව 16 සිට 17 දක්වාත්, අයදුම් පත්‍රය සකස් කළ යුතු ය.)

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.01.15 දිනට පෙර ''**පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවර ''මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල පවතින ගිනි නිවීමේ සේවයේ පවතින ගිනිභට නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීම - 2018'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(iv) අයදුම් කරන පළාත් පාලන ආයතනය ලෙස සඳහන් කළ යුත්තේ, අයදුම්කරු ගිනිභට නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ලැබුවහොත්, අයදුම්කරුගේ මනාපය පරිදි පදිංචි වීමට කැමති හෝ දැනටමත් පදිංචි පළාත් පාලන බල ප්‍රදේශය තම කැමැත්තේ අනුපිළිවෙලට වේ.

| | |
|---|---|
| මහනුවර මහ නගර සභාව - 01 | මාතලේ මහ නගර සභාව - 02 |
| නුවරඑළිය මහ නගර සභාව - 03 | දඹුල්ල මහ නගර සභාව - 04 |

(v) අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් හා නිවැරදිව හා පැහැදිලි අත් අකුරින් එවනු නොලබන හා කැඳවනු ලබන අවසන් දිනට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා නැති සහ දක්වා ඇති කොන්දේසිවලට අදාළ නොවන, අසම්පූර්ණ එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තැපෑලෙන් නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳව මධ්‍යම පළාත් පාලන දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(vi) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකරුවෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 395,520 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

*සටහන.-* විභාග ගාස්තු ගෙවන ලද ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් අයදුම්පත්‍රය සමඟ නොඇමිණිය යුතු ය.

09. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රුපියල් හයසියයක් (600/-) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගත් ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතු ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත හැර වෙනත් ආයතනයකට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බවද සැලකිය යුතු ය.

10. *සේවා කොන්දේසි හා නියමයන්.-*

(i) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, පළාත් සභා මුදල් රීති, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරන නියෝගවලට ද යටත් විය යුතු ය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 සහ ඊට අනුශාංගිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයන්හි විධිවිධාන අනුව සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවයක් සේවයට බැදී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. පත්වීම් දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

(iii) මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත්වීම් ලබන පළාත් පාලන ආතන තුළ වසර 05 ක අනිවාර්ය සේවා කාලයකට යටත් වන අතර එම කාල සීමාව නිමාවන තුරු ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

11. *විභාග මධ්‍යස්ථානය.-*

මෙම විභාගය මහනුවර නගරය තුළ පැවැත්වීමට අපෙක්ෂා කරනු ලැබේ. විභාගය ආරම්භ වන දිනයේ අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

12. *විභාගය පැවැත්වීම.-*

(i) මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පැවැත්වේ.

(ii) මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය සහ මෙම දැන්වීමේ සඳහන් නොවන කරුණු පිළිබඳව තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාතේ පාළාත් පාලන කොමසාරිස් සතු වේ.

(iii) බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් සතු වේ.

(iv) යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිවැරදි තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

2018 දෙසැම්බර් මස 14 වැනි දින,
මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පවතින ගිනිහට නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම - 2018*

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.)

අයදුම්කරන පළාත් පාලන ආයතනය හා සංකේත අංකය කැමැත්තේ අනුපිළිවෙල අනුව :

(ගිනිහටයින් ලෙස පත්වීම් ලැබූ විට පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන බල ප්‍රදේශය තුළ පදිංචි වීම අනිවාර්යය වේ.)

| *කැමැත්තේ අනුපිළිවෙල* | *පළාත් පාලන ආයතනය* | *සංකේත අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

01. i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :....................................................

....................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) PERERA A. B. C.

i. මුලකුරුවලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :....................................................

....................................................

ii. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :....................................................

....................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය.- | | | | | | | | | | | | |

03. i. ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :....................................................

....................................................

ii. ස්ථිර පදිංචි ලිපිනය :....................................................

....................................................

iii. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :....................................................

iv. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :....................................................

v. මධ්‍යම පළාත තුළ පදිංචි කවදා සිට ද? :....................................................

04. දුරකථන අංකය : නිවස :.................................... ජංගම :....................................

05. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E වශයෙන් කොටුව තුළ සඳහන් කරන්න.)

06. i. උපන් දිනය : | | | | |   | | |   | | |

ii. 2018.12.31 වැනි දිනට වයස : අවුරුදු :.............................. මාස :......................... දින :..............................

07. පුරවැසිභාවය :....................................................

08. විවාහක/අවිවාහකභාවය :....................................................

09. උස : අඩි :.............................. අඟල් :..............................

10. බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍ර අංකය :....................................................

11. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

i. අ.පො.ස. (සා. පෙ.) විභාගය : වර්ෂය :................................ විභාග අංකය :..........................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. .................................... | .............................. | 6. .................................... | .............................. |
| 2. .................................... | .............................. | 7. .................................... | .............................. |
| 3. .................................... | .............................. | 8. .................................... | .............................. |
| 4. .................................... | .............................. | 9. .................................... | .............................. |
| 5. .................................... | .............................. | 10. .................................... | .............................. |

ii. *වෘත්තීය සුදුසුකම්* : ...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

12. i. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත.

ii. ''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න. :...........................................................................................................

...........................................................................................................

13. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් :

i. දැනට දරන තනතුර :...........................................................................................................

ii. එම තනතුරට පත් වූ දිනය :...........................................................................................................

iii. සේවා ස්ථානයේ නම හා ලිපිනය :...........................................................................................................

...........................................................................................................

iv. සේවා ස්ථානයේ දුරකථන අංකය :...........................................................................................................

14. i. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය හා දිනය :...........................................................................................................

ii. ලදුපත ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :...........................................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

15. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳව පනවා ඇති කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසු ව ඒ බැව් හෙලිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පිළිගනිමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :......................................

**අත්සන සහතික කිරීම**

16. මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................................ මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අයදුම්පත්‍රයට නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

..................................................,
සහතික කරන්නාගේ අත්සන.

නම :...........................................................................................................
තනතුර :...........................................................................................................
දිනය :...........................................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු/ රු. 395,520ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.)

(රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් අදාළ වේ.)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

17. මෙම අයදුම්කරු වන............................................................................................................................ /මයා .............................. වශයෙන් ........................................... දින සිට......................................................................../ හි සේවය කරන බවත් මෙම අයදුම්පත්‍රයෙහි, සපයා ඇති සියලුම තොරතුරු ඔහුගේ පුද්ගලික ලිපි ගොනුව/සේවා වර්තාව සමඟ සන්සන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. දැනට ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන අතර, පසුගිය ආසන්නතම වසර 05 ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මධ්‍යම පළාත් ගිනිහට නිලධාරී තනතුරට අයදුම් කිරීමට ඔහුට සියලුම සුදුසුකම් තිබෙන බවත්, පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

.................................................
සහතික කරන්නාගේ අත්සන.

නම :..........................................................................................................................
තනතුර :......................................................................................................................
දිනය :........................................................................................................................
(නිල මුද්‍රාව තබන්න.)

12-455

---

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 පෙබරවාරි මස කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් ඃ

2.1 *අධ්‍යාපන සුදුසුකම්* -

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම,

සහ

ii. ආර්ථික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිවිද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

2.2 *වෘත්තීය සුදුසුකම් -*

i. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම, හෝ

ii. ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම, හෝ

iii. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්ව තිබීම, හෝ

iv. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත්ව තිබීම, හෝ

v. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, ගණකාධිකරණය හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

3. *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

ii. මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය. (ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් පදිංචිය සනාථ කළ යුතු ය.)

iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ත් 30 ත් අතර විය යුතු ය.

iv. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

4. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි එහි MN 3-2016 අනුව,

රු. 31,040 -10 x 445-11 x 660-10 x 730 -10x750 -57,550/= වේ.

(2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

5. *සේවා කොන්දේසි :*

5.1 මෙම තනතුර ස්ථිර ය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

5.2 මෙම තනතුරට පත්කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

5.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතු ය.

5.4 සෑම අපේක්ෂකයකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක "සේවය" කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5.5 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත්

මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට යටත් විය යුතු ය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*

6.1 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

6.2 විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ විෂයයන් 02 හිම ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

6.3 පවතින පුරප්පාඩු සියල්ල විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ලැබේ.

7. *ලිඛිත විභාගය :*

7.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය කුමන හේතුවක් නිසා හෝ පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

7.3 *විභාගය සඳහාවන විෂයය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයන් ද, විශ්ලේෂණ හැකියාවන්ද, තීරණ ගැනීමේ ශක්තීන් ද, විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. සාමාන්‍ය දැනීම | *(අ)* ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික හා දේශපාලන දැනුම<br>*(ආ)* සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම<br><br>බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම්වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |

8. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු වශයෙන් රු.600/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි අයදුම්කරු/අයදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

9. *අයදුම් කළ යුතු ක්‍රමය :*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.14 වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

9.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9.3 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

9.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.01.14 වේ.

10. මෙම නිවේදනයේ දක්වා ඇති ආකෘතියට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන :*

විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

12. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

13. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 3 කට පෙර විභාග ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පහත සඳහන් විස්තර සහිතව දැන්විය යුතු ය. විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

I. විභාගයේ නම :..........................................................................
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................................
III. ලිපිනය :..........................................................................
IV. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................
V. අයදුම්පත තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ අංකය :..........................................................................

14. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ පත්වීම් ලබාදෙන සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2018 දෙසැම්බර් මස 05 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

1. 1.1 මුල්කුරු සමග නම (සිංහලෙන් /දෙමළෙන්) :..........................................................................

..........................................................................මයා/මිය/මෙනෙවිය

1.2 මුල්කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Mrs./Miss..........................................................................

..........................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :..........................................................................

.......................................................................... මයා/මිය/මෙනෙවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Mrs./Miss.......................................................................................................

.............................................................................................................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්) :.............................................................................................

.............................................................................................................................................................................

2.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.............................................................................................

.............................................................................................................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :.............................................................................................................

.............................................................................................................................................................................

2.4 දුරකථන අංකය : පෞද්ගලික :............................................

3. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

4. 4.1 උපන් දිනය : වර්ෂය :.......................... මාසය :.............................. දිනය :................................

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2019.01.14 දිනට වයස :

අවුරුදු :............................ මාස :.......................... දින :..........................

5. 5.1 අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :.....................................................................

5.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :......................................................................................

5.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :...........................................................................................

5.4 2019.01.14 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය : අවුරුදු :............. මාස :............... දින :...............

06. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 2 යටතේ)

*(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයට පෙනී සිටි වර්ෂය :..........................................

විභාග අංකය : ....................................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 06 | | |
| 2 | | | 07 | | |
| 3 | | | 08 | | |
| 4 | | | 09 | | |
| 5 | | | 10 | | |

*(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයට පෙනී සිටි වර්ෂය :.........................................................
විභාග අංකය :.................................................................

| | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

(ඉ) *වෘත්තීය සුදුසුකම්.-*

(නිවේදනයේ අංක 2.2 යටතේ හදාරා ඇති පාඨමාලා පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.)
මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :.......................................... මුදල :..........................................
දිනය :..........................................
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..........................................

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |

08. *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද එකඟ වෙමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක්

දරන නිලධාරියෙකු හෝ රු. 32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන .................................................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, විභාග ගාස්තු ගෙවා ඇති බව ද , ඔහු/ ඇය මා ඉදිරිපිට දී .............................................. දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන :..........................................................................................
සහතික කරන අයගේ නම :..........................................................................................
තනතුර හා නිල මුද්‍රාව :..........................................................................................
දිනය :..........................................................................................

12-522/1

---

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 පෙබරවාරි මස කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව සම්මාන 4 ක් සහිතව එකවර විෂයයන් හයකින් සමත් ව තිබීම.

*සහ*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යාව, ජීව විද්‍යාව සමග කෘෂි විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන් සියල්ලම එකවර සමත් වීම.

1.2 *වෘත්තීය සුදුසුකම් :*

i. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, ලබුදූව, කරපිංච, වාරියපොල, බිබිල, වවුනියාව සහ අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාල මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය,

*හෝ*

ii. අම්පාරේ හාඩි කාර්මික විද්‍යාලය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (කෘෂිකර්ම) ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

iii. ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

iv. රජයට අනුබද්ධ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

02. *වෙනත් සුදුසුකම්.-*

2.1 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) වයඹ පළාතේ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය මගින් පදිංචිය සනාථ කළ යුතු ය.)
2.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.
2.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සංලක්ෂය :-*

යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

03. *වැටුප් පරිමාණය.-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 - 2016 අනුව,

රු. 31,040-10 x 445-11 x 660-10 x 730-10 x 750- රු. 57,550/- වේ.

(2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. *සේවා කොන්දේසි.-*

4.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.
4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.
4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.
4.5 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.
4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට ද, රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

5.1 වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත සියලු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

5.2 ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ විෂයයන් 02 හිම ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

06. *ලිඛිත විභාගය.-*

6.1 ලිඛිත විභාගය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (බහුවරණ ප්‍රශ්න පත්‍රයකි) | පැය 01 | 100 | 40% |

සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශය උපලේඛන 01 හි සඳහන් වේ.

07. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රු. 600 ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතු ය. වයඹ පළාතේ පදිංචි අයැදුම්කරු/ අයැදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

08. *අයදුම් කළ යුතු ක්‍රමය.-*

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.14වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, "වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018" යනුවෙන් සඳහන් කළ යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරණ නිලධාරියෙකු හෝ රු. 32,960 කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.01.14 වේ.

09. මෙම නිවේදනයේ දක්වා ඇති ආකෘතියට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාල සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන :*

විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන්විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

11. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. *විභාග ප්‍රවේශපත්‍ර.-*

විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පහත සඳහන් විස්තර සහිතව දැන්විය යුතු ය. විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

i. විභාගයේ නම
ii. අයදුම්කරු/අයදුම්කාරියගේ සම්පූර්ණ නම
iii. ජාතික හැඳුනුම්පත් අංකය
iv. ලිපිනය
v. අයදුම්පත්‍රය තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ විස්තර

13. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

## උපලේඛන 01 - විස්තරාත්මක විෂය නිර්දේශය

01. බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය.

   *(අ)* දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
   *(ආ)* රැකියා නියුක්තිය
   *(ඇ)* කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්ත්වය

2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

3. පස සහ ශාක පෝෂණය

   *(අ)* පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම.
   *(ආ)* ශාක පෝෂණය, පාංශු/ ශාක පෝෂණ කළමනාකරණය
   *(ඇ)* පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

4. පාංශු රසායන පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

5. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය

   *(අ)* විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
   *(ආ)* ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම
   *(ඇ)* ජල වහනය හා එහි වැදගත්කම

6. ගොවිපල යාන්ත්‍රීකරණය :

   *(අ)* ගොවිපල යාන්ත්‍රීකරණයේ වාසි අවාසි
   *(ආ)* බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   *(ඇ)* ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   *(ඈ)* ඉහත යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව

7. කෘෂිකාර්මික ව්‍යාප්තිය :

(අ) කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය
(ආ) කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

8. පටක රෝපණය :

(අ) පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම
(ආ) පටක රෝපණයේ භාවිතයන්/ යෙදීම් උදාහරණ
(ඇ) පටක රෝපණයේ වාසි අවාසි

9. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම :

(අ) පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම
(ආ) පැළෑටි නිරෝධායන ක්‍රම

10. ශාක සංරක්ෂණය :

(අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)
(ආ) ශාක සංරක්ෂණයේ ක්‍රම (ශාක/ ජාන ප්ලාස්ම)

11. ජාන තාක්ෂණය :

(අ) DNA වල වැදගත්කම
(ආ) ජානය යනු කවරෙක්ද? එහි ක්‍රියාකාරිත්වය
(ඇ) DNA තාක්ෂණය යොදා ගැනීමේ අවස්ථා
(ඈ) ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩි දියුණු කිරීමට ඇති හැකියාව

12. ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම :

(අ) ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන
(ආ) මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ

13. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම :

14. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම :

(අ) අනිලමානය, රෝඩ්රේසය, ඩම්පිලෙවලය, තියෝඩර්ලයිටරය
(ආ) 1 : 50,000 - 1 : 10, 000 අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

15. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම :

(අ) ඉඩම් වර්ග - රජයේ ඉඩම්
පුද්ගලික ඉඩම්
ප්‍රවේණි ඉඩම්

16. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැනුම :

(අ) වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදා දීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය
ඉඩම් නොමැති පුද්ගලයින් හඳුනා ගැනීම
බිම්සවිය වැඩසටහන
ඉඩම් කැබලි ලක්ෂයේ වැඩසටහන

17. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය ඃ

(අ) සන්නස්, නින්දගම්
(ආ) බදුකර, ස්වර්ණ භූමි, ජය භූමි, රත්න භූමි, රත්බිම

**ආදර්ශ අයැදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

සිංහල - ☐ දෙමළ - ☐ ඉංග්‍රීසි - ☐

01. 1.1 මුල්කුරු සමග නම (සිංහලෙන් /දෙමළෙන්) ඃ..........................................................................................

..........................................................................................මයා/මිය/මෙනෙවිය

1.2 මුල්කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ඃ Mr./Ms./Mrs..........................................................................

..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) ඃ..........................................................................................

.......................................................................................... මයා/මිය/මෙනෙවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ඃ Mr./Ms./Mrs..........................................................................

..........................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය ඃ

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය ඃ- (සිංහලෙන්/දෙමළෙන්) ඃ..........................................................................................

..........................................................................................

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ..........................................................................................

..........................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ඃ..........................................................................................

..........................................................................................

2.4 දුරකථන අංකය ඃ............................................

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

3.1 ස්ත්‍රී - F ☐ පුරුෂ - M ☐

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2019.01.14 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය :........................................................................

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :........................................................................................

4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :..............................................................................................

4.4 2019.01.14 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය : අවුරුදු :............. මාස :............... දින :...............

05. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

5.1 *අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයට පෙනී සිටි වර්ෂය :..........................................
විභාග අංකය : ....................................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 06 | | |
| 2 | | | 07 | | |
| 3 | | | 08 | | |
| 4 | | | 09 | | |
| 5 | | | 10 | | |

5.2 *අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයට පෙනී සිටි වර්ෂය :............................................................
විභාග අංකය :...................................................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

5.3 *වෘත්තීය සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

06. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

ලදුපත් අංකය :..........................................
මුදල :..........................................
දිනය :..........................................
ලදුපත නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..........................................

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. |

07. *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද එකඟ වෙමි.

*(ආ)* ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.32,960/ කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ...........................................................................මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන :...........................................................................................
සහතික කරන අයගේ නම :...........................................................................................
තනතුර හා නිල මුද්‍රාව :...........................................................................................
දිනය :...........................................................................................

12-522/2

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2018 (විවෘත)

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුරුණෑගල මහ නගර සභාවේ විධායක සේවා ගණයෙහි නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම හෝ නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

1.2 *පළපුරුද්ද :*

අධිකරණ කටයුතු සම්බන්ධයෙන් වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම (මෙය අවම වශයෙන් අධිකරණයේ වසර 15 ක් සක්‍රීය සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් සනාථ කළ යුතුවේ.)

02. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

03. *වෙනත් සුදුසුකම් :*

(i) මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් පදිංචිය සනාථ කළ යුතු ය.)

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

(iii) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

04. *වැටුප් පරිමාණය.-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි SL 1-2016 අනුව රු. 47,615 - 10x1335 - 8x1630 - 17x2170 - රු. 1,10,895 වේ.
(2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

05. *සේවා කොන්දේසි.-*

(i) මෙම තනතුර ස්ථිර ය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතු ය.

(iv) රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණ නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.

(v) මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ/ උසස් කිරීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, , දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට ද යටත් විය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

නිවේදනයේ දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සමත්වීම සඳහා 60% ක් ලකුණු ලබා ගත යුතු ය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරු බඳවා ගනු ලැබේ.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.-*

7.1 සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන ක්ෂේත්‍ර :

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br><br>■ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය<br><br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා ලකුණු - 20<br>- දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා ලකුණු - 20<br>- දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා ලකුණු - 10<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා ලකුණු - 15<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා ලකුණු - 10<br><br>***සටහන*** - ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතු ය.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | 20 |

| | |
|---|---|
| *අතිරේක වෘත්තීය සුදුසුකම් :*<br><br>■ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට - ලකුණු 05 බැගින්)<br><br>■ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට/පැය 720 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට - ලකුණු 03 බැගින්)<br><br>■ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට/පැය 360 කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට - ලකුණු 02 බැගින්) | 15 |
| *අතිරේක පළපුරුද්ද :*<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පුද්ගලික අංශයේ පළපුරුද්ද :<br><br>- මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම - ලකුණු 30<br><br>(මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කල වසර 03 ක සේවා කාලය හැර)<br><br>- (අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | 30 |
| *පරිගණක සාක්ෂරතාවය :*<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා - (ලකුණු 15)<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලොමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා - (ලකුණු 10)<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br><br>- මාස 06 / පැය 720 - ලකුණු 07<br>- මාස 03 / පැය 360 - ලකුණු 05 | 15 |
| *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :*<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය - ලකුණු 15<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලොමා පාඨමාලාවක් සඳහා (වසර 01 හෝ පැය 1500) - ලකුණු 10<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br><br>- මාස 06 / පැය 720 - ලකුණු 07<br>- මාස 03 / පැය 360 - ලකුණු 05 | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| මුළු ලකුණු | 100 |

08. *විභාග ගාස්තු:-*

සෑම අයදුම්කරුවෙකු ම විභාග ගාස්තු වශයෙන් රු. 1,200/-ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතු ය. වයඹ පළාතේ තමන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාග න්නා ලද ව.ප.ස.මු/2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතු ය. මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.14.වැනි දින හෝ එදිනට ප්‍රථම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, "වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2018" යනුවෙන් සඳහන් කළ යුතු ය.

9.2 *අත්සන සහතික කිරීම :-* මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු: 32,960/-හෝ ඊට ඉහළ මූලික මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

9.3 දැනටමත් රාජ්‍ය/ පළාත් සභා රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

9.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :- 2019.01.14

10. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයඳුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය. තව ද, නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

13. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

15. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2018 දෙසැම්බර් මස 05 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම - 2018***

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන් ) :..............................................................................

..............................................................................

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) :..............................................................................

..............................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..............................................................................

..............................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................................................................

..............................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය :..............................................................................

2.2 දුරකතන අංකය : පෞද්ගලික : .............................. රාජකාරි : ...........................

03. ස්ත්‍රී/ පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

04. උපන් දිනය : වර්ෂය :........................ මාසය : ......................... දිනය :..........................

4.1 2019.01.14. වැනි දිනට වයස : අවුරුදු :........................... මාස :.................................. දින :....................................

05. 2019.01.14 වැනි දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :

අවුරුදු :........................ මාස :......................... දින :........................

06. *සුදුසුකම්* :

6.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :-..........................................................................................................
6.2 පළපුරුද්ද :-..........................................................................................................
6.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :-..........................................................................................................
6.4 අතිරේක වෘත්තීය සුදුසුකම් :-..........................................................................................................
6.5 අතිරේක පළපුරුද්ද :-..........................................................................................................
6.6 පරිගනක සාක්ෂරතාවය :-..........................................................................................................
6.7 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :-..........................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1 ලදුපත් අංකය :-...........................
මුදල :-...........................................
දිනය :- .........................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ...........................................................

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. |

08. *අයදුම්කරුගේ සහතිකය :*

.................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව ම දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................................

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ ඇය .......................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :...............................................................................
අත්සන :...............................................................................
තනතුර හා නිල මුද්‍රාව :...............................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිළධාරියෙකු හෝ රු:32,960/- මූලික මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ............................................................ මහතා /මහත්මිය /මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බව ද, ඔහු / ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද, මෙම පත්වීමක් සඳහා තෝරාගනු ලැබුව හොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද, ඔහුගේ / ඇයගේ අයදුම්පතේ දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ නිවැරදි බව සහ මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව නීති නිලධාරී තනතුර සඳහා ඔහු / ඇය සුදුසු බව ද මම සහතික කරමි.

....................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

12-522/3

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019 පෙබරවාරි මස කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

1.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවක් සහ විද්‍යාව, ගණිතය ඇතුළු විෂයයන් හතරකට(04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම ;

*සහ*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර)

1.2 *වෘත්තීය සුදුසුකම් :*

(i) කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, ලබුදූව, වාරියපොල, බිබිල, වවුනියාව සහ අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාල මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(ii) අම්පාර හාඩි කාර්මික විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන කෘෂි විද්‍යාව පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(iii) ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(iv) රජයේ අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

(v) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම.

02. *වෙනත් සුදුසුකම්.-*

2.1 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) වයඹ පළාතේ ස්ථිර පදිංචිය සහිත ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් පදිංචිය සනාථ කළ යුතු ය.)

2.4 අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

2.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සංලක්ෂය :*

යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

03. *වැටුප් පරිමාණය.-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 - 2016 අනුව,

රු. 31,040-10 x 445-11 x 660-10 x 730-10 x 750-රු.57,550 වේ.

(2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධි විධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. *සේවා කොන්දේසි.-*

4.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද , වයඹ පළාත් සභා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට ද,රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

5.1 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

5.2 විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ විෂයයන් 02 හිම ලකුණු එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

5.3 පවතින පුරප්පාඩු ප්‍රමාණයෙන් 70% ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ලැබේ.

5.4 සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත 30% ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් එම සංඛ්‍යාව ද විවෘත තරග විභාගයෙන්ම තෝරා ගනු ලැබේ.

06. *ලිඛිත විභාගය.-*

6.1 ලිඛිත විභාගය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශය උපලේඛන 01 හි සඳහන් වේ.

07. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතු ය. වයඹ පළාතේ පදිංචි අයදුම්කරු/ අයදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

08. *අයදුම් කළ යුතු ක්‍රමය.-*

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.14 වැනි දින හෝ එදිනට ප්‍රථම "**ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, "**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2018**" යනුවෙන් සඳහන් කළ යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8.3 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු.32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.01.14 වේ.

09. මෙම නිවේදනයේ දක්වා ඇති ආකෘතියට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන :*

විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

11. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. *විභාග ප්‍රවේශපත්‍ර.-*

විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබිණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පහත සඳහන් විස්තර සහිතව දැන්විය යුතු ය. විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

i. විභාගයේ නම
ii. අයදුම්කරු /අයදුම්කාරියගේ සම්පූර්ණ නම
iii. ජාතික හැඳුනුම්පත් අංකය
iv. ලිපිනය
v. අයදුම්පත්‍රය තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ විස්තර

13. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2018 දෙසැම්බර් මස 05 වැනි දින.

**උපලේඛන 01 - විස්තරාත්මක විෂය නිර්දේශය**

01. *බුද්ධි පරීක්ෂණය :*

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික හා බහුවරණ ප්‍රශ්න වලින් යුක්තය.

02. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :*

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය.

(අ) දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ ඇති දායකත්වය
(ආ) රැකියා නියුක්තිය
(ඇ) අපනයන හා ආනයනයේදී කෘෂිකර්මයට හිමි තැන

2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

3. *පස සහ ශාක පෝෂණය :*

(අ) පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි එහි බලපෑම.
(ආ) ශාක පෝෂණය, පාංශු/ ශාක පෝෂණ කළමනාකරණය
(ඇ) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

4. *වී නිෂ්පාදනය :*

(අ) පාංශු හා දේශගුණික අවශ්‍යතාවය
(ආ) ප්‍රභේද
(ඇ) බිම් සකස් කිරීම හා තවාන් පාලනය
(ඈ) පලිබෝධ හා රෝග මර්දනය
(ඉ) පොහොර යෙදීම.
(ඊ) ජල කළමනාකරණය
(උ) අස්වනු නෙලීම හා පසු අස්වනු තාක්ෂණ විධි
(ඌ) බිත්තර වී නිෂ්පාදනය

5. *වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය :*

(අ) ලොකු ලූණු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු සහ වෙනත් බෝගවල ප්‍රභේද, පාංශු හා දේශගුණික අවශ්‍යතා හා රෝපණ ක්‍රියාකාරකම්, ගුණාත්මක බීජ නිෂ්පාදනය, ගබඩා සහ අලෙවිකරණය, පසු අස්වනු තාක්ෂණය, වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම.

6. *එළවලු නිෂ්පාදනය :*

(අ) එළවලු තවාන් පාලනය
(ආ) එළවලු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙලීම හා සැකසීම.

7. *පලතුරු :*

(අ) පලතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙලීම හා සැකසීම.

8. *බෝග ආරක්ෂණය :*

(අ) බෝගවලට වැළඳෙන ප්‍රධාන රෝග හා පලිබෝධ හඳුනා ගැනීම, ඒවායේ පාලන විධි
(ආ) වල් මර්දනය, වල් මර්දන ක්‍රම
(ඇ) පලිබෝධ නාශක පාලනයේදී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම

9. *පාංශු රසායනය* - පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

10. *වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය :*

*(අ)* විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
*(ආ)* ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම
*(ඇ)* ජල වහනය හා එහි වැදගත්කම

11. *ගොවිපල් යාන්ත්‍රීකරණය :*

*(අ)* ගොවිපල් යාන්ත්‍රිකරණයේ වාසි අවාසි
*(ආ)* බිම් සකස් කිරීමට භාවිතා කරන යන්ත්‍රෝපකරණ
*(ඇ)* ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
*(ඈ)* ඉහත යන්ත්‍ර ක්‍රියා කිරීම හා නඩත්තුව

12. *මී මැසි පාලනය :*

*(අ)* ආර්ථික වැදගත්කම
*(ආ)* මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම.
*(ඇ)* අස්වනු ලබා ගැනීම හා වෙළඳපොලට සකස් කිරීම.

13. *මල් පැළ වගාව හා භූමි අලංකරණය :*

*(අ)* ආර්ථික වැදගත්කම
*(ආ)* භූමි අලංකරණය ක්‍රම
*(ඇ)* වෙළඳපොල සඳහා කැපූ මල් නිෂ්පාදන හා ඒවා වෙළඳපොලට සකස් කිරීම.
*(ඈ)* වෙළඳපොල සඳහා විසිතුරු පැළ නිෂ්පාදනය

14. *ආරක්ෂිත බෝග වගාව :*

*(අ)* වැදගත්කම
*(ආ)* සැලසුම් කිරීම.
*(ඇ)* බෝග තෝරා ගැනීම, ජලය/පොහොර යෙදීම.
*(ඈ)* පවත්වාගෙන යාම හා අස්වනු සකස් කිරීම.

15. *සත්ව පාලනය :*

*(අ)* කුකුල් නිෂ්පාදනය හා කිරි ගව කර්මාන්තයේ ඇති වැදගත්කම
*(ආ)* සමෝදාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් නිෂ්පාදන පවත්වා ගැනීම.

16. *කෘෂිකාර්මික ව්‍යාප්තිය :*

*(අ)* කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ගය හා ක්‍රමවේදයන්
*(ආ)* කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

සිංහල - ☐ දෙමළ - ☐ ඉංග්‍රීසි - ☐

1. 1.1 මුල් අකුරු සමග නම (සිංහලෙන් /දෙමළෙන්) :............................................................

............................................................මයා/මිය/මෙනෙවිය

1.2 මුල් අකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs............................................................

............................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් /දෙමළෙන්) :............................................................

............................................................ මයා/මිය/මෙනෙවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs............................................................

............................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2. 2.1 ස්ථිර පදිංචි ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්) :............................................................

............................................................

2.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :............................................................

............................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :............................................................

............................................................

2.4 දුරකතන අංකය :............................................

3. ස්ත්‍රී පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ✓ලකුණ යොදන්න.)

3.1 ස්ත්‍රී - F ☐ පුරුෂ - M ☐

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2019.01.14 වැනි දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. 4.1 අයදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :....................................................................

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.........................................................................................

4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :.............................................................................................

4.4 2019.01.14 වැනි දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය : අවුරුදු :............. මාස :............... දින :...............

05. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :*

5.1 *අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයේ වර්ෂය හා මාසය :..........................................
විභාග අංකය : ....................................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 *අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

විභාගයේ වර්ෂය හා මාසය :..........................................
විභාග අංකය :..................................................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

5.3 *වෘත්තීය සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

06. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

ලදුපත් අංකය :.......................................... මුදල :..........................................

දිනය :..........................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..........................................

| ලදුපත මෙහි අලවන්න. |
|---|

07. *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමටද එකඟ වෙමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය.

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .................................................................. දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන :..........................................................................................
සහතික කරන අයගේ නම :..........................................................................................
තනතුර හා නිල මුද්‍රාව :..........................................................................................
දිනය :..........................................................................................

12-522/4

---

**වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය -2018**

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා වයඹ පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති වයඹ පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පහත සඳහන් දෙමළ මාධ්‍ය විශේෂ විෂයයන් සඳහා වෙනත් පළාත් වල පදිංචිකරුවන්ට ද ඉල්ලුම් කළ හැක.

| *විෂයය අංකය* | *විෂයය* |
|---|---|
| 3 | ගණිතය |
| 4 | විද්‍යාව |
| 10 | චිත්‍ර |
| 15 | තොරතුරු තාක්ෂණය |
| 16 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය |

02. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයන් සඳහා දිස්ත්‍රික් පාදක ක්‍රමය මත උපාධිධාරීන් බඳවා ගැනීම සිදු කරන අතර එම බඳවා ගැනීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද ඉල්ලුම් කළ යුතු ය. එක් දිස්ත්‍රික්කයක විෂයය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අනෙක් දිස්ත්‍රික්කයේ එම විෂයන් සඳහා සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

දෙමළ මාධ්‍ය විශේෂ විෂයන් සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් වයඹ පළාත තුළ නොමැති අවස්ථාවක පමණක් වෙනත් පළාත්වල පදිංචි කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවලට අයදුම්කරන ලද සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

03. පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. එක් එක් දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලට අදාළ විෂයය පුරප්පාඩු උපලේඛනයෙහි දැක්වේ.

04. *වැටුප් ක්‍රමය.-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි GE 1 - 2016 අනුව රු. 27740 - 6 x 300 - 7 x 380 - 2 x 445 - 33090/= වේ. (2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

i. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍ර වලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛනයෙහි සඳහන් කර ඇති විෂයයන් ට අදාල උපාධියක් ලබා තිබිය යුතු ය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතු ය.

*සහ*

ii. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් සහිතව එම විභාගය සමත්ව තිබිය යුතු ය.

*ඉතා වැදගත් :* (ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේදී සැලකිල්ලට ගත යුතු ය.)

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/ විෂයයන් අනුව පමණක් අදාල ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.
- ඉල්ලුම්කළ හැකි උපරිම විෂයයන් සංඛ්‍යාව 3 කි. කැමැත්තේ ප්‍රමුඛතාවය අනුව සටහන් කළ යුතු ය.
- ඉල්ලුම් කළ විෂයය/විෂයයන් කිසිදු හේතුවක් නිසාවත් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.2 *කායික සහ මානසික යෝග්‍යතාවය.-*

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.3 *වයස.-* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය.

5.4 *වෙනත් සුදුසුකම්.-*

i. අයදුම්කරු /අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.
iii. වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.
iv. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.)

I වන ඡේදයේ සඳහන් දෙමළ මාධ්‍ය විශේෂ විෂයයන් සඳහා අයදුම්කරන ලද වෙනත් පළාත්වල පදිංචි අයදුම්කරුවන් තමන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

06. *සේවා කොන්දේසි.-*

i. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධන වලට ද, යටත්ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

ii. මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

iii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

v. 2014.01.21 දිනැති රා.ප.ච.01/2014 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව සේවයට පත්වී වසර 05 ක් ඇතුළත තනතුරට නියම කර ඇති දෙවෙනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

vi. වයඹ පළාතේ පදිංචි පත්වීම්ලාභීන් මුල් පත්වීම ලබන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර හයක කාලයක් සේවයේ යෙදිය යුතු වේ. වෙනත් පළාත්වල පදිංචි පත්වීම්ලාභීන් මුල් පත්වීම ලබන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් වසර 10 ක කාලයක් සේවයේ යෙදිය යුතු ය.

vii. තම මුල් පත්වීම ලබන පාසල අතිදුෂ්කර/දුෂ්කර පාසලක් නොවන කල්හි තම සේවා කාලය තුළ ඕනෑම අවස්ථාවකදී අවම වශයෙන් වසර 05 ක කාලයක් අතිදුෂ්කර/දුෂ්කර පාසලක සේවය කිරීමට ද මෙම පත්වීම්ලාභීන් බැඳී සිටී.

07. *බඳවා ගැනීම.-*

7.1 *බඳවා ගැනීමේ ක්‍රමය :*

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් එම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද, පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් එම දිස්ත්‍රික්කයේ පාසල්වල පවතින විෂයය පුරප්පාඩු සඳහා ද දිස්ත්‍රික් පදනම මත බඳවා ගනු ලැබේ.

කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක වල දෙමළ මාධ්‍යය විශේෂ විෂයයන් සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී පමණක් වෙනත් පළාත්වල අයදුම්කරුවන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

තෝරාගැනීම් සඳහා ලිඛිත තරග විභාගයක් පැවැත්වේ. ලිඛිත තරග විභාගයෙන් සමත් වූවන් විෂයය පුරප්පාඩු අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

7.2 *ලිඛිත තරග විභාගය.-* මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විෂය නිර්දේශය :*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

සමාජ, ආර්ථික, දේශපාලනික ක්ෂේත්‍ර පිළිබඳව වූ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.)

7.3 *විභාග පරිපාටිය.-*

i. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ඉල්ලුම් කළ හැක.
ii. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) ටම පෙනී සිටිය යුතු ය.
iii. සෑම අපේක්ෂකයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයම විය යුතු ය.
iv. ඉංග්‍රීසි විෂයය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අයදුම් කළ යුතු ය.
v. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.4 *සම්මුඛ පරීක්ෂණය.-*

මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*(අ)* පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම. (උපරිම ලකුණු 07)

| | |
|---|---|
| 1 පන්තිය | ලකුණු 07 |
| 11 පන්තිය ඉහළ පෙළ | ලකුණු 05 |
| 11 පන්තිය පහළ පෙළ | ලකුණු 03 |

*(ආ)* අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම. (උපරිම ලකුණු 10)

| *අනු අංකය* | *නිර්ණායකය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | දහම් පාසැල් අවසාන විභාග සහතිකය හෝ වෙනත් ආගම් සඳහා ඒ හා සමාන මට්ටමේ විභාගයක් සමත්වී ඇති බවට පිළිගත් සහතිකයක් ලබා තිබීම. | 05 |
| 02 | ක්‍රීඩා, සෞන්දර්ය ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා රජයේ හෝ රජය පිළිගත් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන, තෙවන ජයග්‍රහණ සඳහා සහතිකයක් ලබා තිබීම. | 05 |
| | මුළු ලකුණු | 10 |

7.5 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 08)

ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරු විසින් අයදුම් කරන ලද විෂයකට අදාළ මාතෘකාවක් යටතේ විනාඩි 5 කට නොඅඩු ඉදිරිපත් කිරීමක් කළ යුතුයි. මෙහිදී අයදුම්කරු සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය සහ සන්නිවේදන කුසලතාවය පිළිබඳ විශේෂයෙන් සලකා බලනු ලැබේ.

08. *විභාග මධ්‍යස්ථාන :*

මෙම තරග විභාගය පහත දැක්වෙන නගර වලදී පවත්වනු ලැබේ. වයඹ පළාතේ ස්ථිර පදිංචිකරුවන් තමන් පදිංචි දිස්ත්‍රික්කය අනුව නගරය තෝරා ගත යුතුයි. වෙනත් පළාත්වල ස්ථිර පදිංචිකරුවන් තමන් පත්වීම් ලැබීමට මනාපය පලකරන දිස්ත්‍රික්කය තෝරා ගත යුතු ය.

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | 1 |
| පුත්තලම | පුත්තලම | 2 |

09. *තෝරා ගැනීමේ ක්‍රමය.-*

*(අ)* වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

*(ආ)* යම්කිසි විෂයයක්/විෂයයන් සඳහා එක් දිස්ත්‍රික්කයකින් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් තෝරාගෙන අවසන් වුවද එම දිස්ත්‍රික්කයේ තවදුරටත් පුරප්පාඩු පවතින්නේනම් ඒ ඒ විෂයයන්ට ඉල්ලුම් කළ අනෙක් දිස්ත්‍රික්කයේ පදිංචි අයදුම්කරුවන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුවෙන් තෝරාගනු ලැබේ.

I වන ඡේදයේ සඳහන් දෙමළ මාධ්‍ය විශේෂ විෂයයන් සඳහා දිස්ත්‍රික්ක දෙකේම අයදුම්කරුවන් නොමැති අවස්ථාවක පමණක් වෙනත් පළාත්වල අයදුම්කරුවන් තෝරාගැනීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

*(ඇ)* යම්කිසි අපේක්ෂකයෙකු විෂයයන් දෙකකට (02) හෝ තුනටම (03) තේරී පත්වී ඇති අවස්ථාවක එම අයට පත්වීම් ලබා දෙන විෂය පිළිබඳව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

10. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය.

දෙමළ මාධ්‍ය විශේෂ විෂයයන් සඳහා වෙනත් පළාත් වලින් කුරුණෑගල දිස්ත්‍රික්කයට ඉල්ලුම්කරන අයදුම්කරුවන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ද, පුත්තලම දිස්ත්‍රික්කයට ඉල්ලුම්කරන අයදුම්කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ද මුදල් ගෙවා තමා නමින් ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය.

**ව.ප.ස.මු. 02 ආකෘතියේ** ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් **කිසිවක් භාරගනු** නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.)

11. *අයදුම් කළ යුතු පිළිවෙල.-*

11.1 *(අ)* *අයදුම්පත්‍රය.-* සෙ. මී. 21 x 35.5 (ලීගල්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින් අංක 01 සිට 06 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, අංක 07 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද, ඇතුළත් වන සේ අයදුම්පත් පිළියෙල කරගත යුතු ය.

*(ආ)* ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරුවන් සැලකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ඇ)* අයදුම් කරනු ලබන විෂයය/විෂයයන් කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

*(ඇ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනය - 2019.01.14

11.2 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

අයදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකරුවකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,960/= කට වැඩි ආරම්භක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/ පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.14 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙලවරේ පැහැදිලිව **"වයඹ පළාත් සභා ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම - 2018"** සහ **පදිංචි දිස්ත්‍රික්කය** සඳහන් කළ යුතු ය.

11.4 නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා 2019.01.14 දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශපත්‍රයක් නිකුත් කරනු ලැබේ. එහෙත් මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

12. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලි වලින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

*හෝ*

*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රයක්

*සටහන :* විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

13. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීමට හැකිවේ.

14. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් පළකරනු ලැබේ. විභාග පැවැත්වෙන දිනට දින 3 කට පෙර විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව වහාම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය**

**සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

i. විභාගයේ නම
ii. අයදුම්කරුගේ සම්පූර්ණ නම
iii. ලිපිනය
iv. ජාතික හැඳුනුම්පත් අංකය
v. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ කාර්යාලය, ලියාපදිංචි අංකය හා යැවූ දිනය :
vi. අයදුම්කරුගේ දුරකතන අංකය

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

16. මෙම විභාගය පැවැත්වීම,කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2018 දෙසැම්බර් මස 05 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

*වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018*

01. *ස්ථිර පදිංචිය.-*

| *වයඹ පළාත තුළ පදිංචි නම්* | |
|---|---|
| ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- | |
| නගර අංකය :- | |

| *වෙනත් පළාතක පදිංචි නම් (දෙමළ මාධ්‍ය විශේෂිත විෂයයන් සඳහා පමණි.)* | |
|---|---|
| ස්ථිර පදිංචි පළාත :- | |
| අයදුම් කිරීමට අපේක්ෂිත දිස්ත්‍රික්කය :- | |
| නගර අංකය :- | |

02. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :-*

සිංහල - S    දෙමළ - T    ඉංග්‍රීසි - E  ☐

(පත්වීම් ලැබීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයට අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

03.

| *ඉල්ලුම් කරන විෂයය/විෂයයන්* | *විෂය අංකය* |
|---|---|
| | |
| | |
| | |

(ඉල්ලුම් කළ හැකි උපරිම විෂයයන් ගණන 03 කි)

04. 4.1 මුලකුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන් ) :-..........................................................................................

..........................................................................................

4.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................

..........................................................................................

4.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :-..........................................................................................

..........................................................................................

4.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................

..........................................................................................

05. 5.1 වර්තමාන ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :-..........................................................................................

..........................................................................................

(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

5.2 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................................

..........................................................................................

5.3 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ............................................. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- ..............................

5.4 දුරකථන අංකය :-..........................................................................................

06. 6.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6.2 උපන් දිනය :- වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

6.4 ස්ත්‍රී/ පුරුෂ භාවය :- පුරුෂ - M ස්ත්‍රී - F
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

6.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. *ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :-*

7.1 උපාධිය :- ..........

7.2 උපාධිය ලබා ගත් විශ්වවිද්‍යාලය :-..........

7.3 උපාධියට හදාරන ලද ප්‍රධාන විෂයය /විෂයයන් :-..........

| |
|---|
| |
| |
| |
| |
| |

7.4 ලබා ඇති පන්ති සාමාර්ථය :- ..........

7.5 උපාධිය වලංගු වන දිනය :-..........

7.6 උපාධිය හදාරන ලද භාෂා මාධ්‍යය :- ..........

7.7 *අ.පො.ස. (සා. පෙළ) :*

| | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|
| පළමු වර | | |
| දෙවන වර | | |

| | *විෂයය* | *පළමු වර සාමාර්ථය* | *දෙවැනි වර සාමාර්ථය* |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

7.8 *අ.පො.ස. (උ පෙළ) ඃ*

*සමත් වූ වර්ෂය ඃ*............................................... *විභාග අංකය ඃ*..................................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

08. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ-*

8.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඃ.................................................................................................................

8.2 ලදුපත් අංකය හා දිනය ඃ.............................................................................................................................................

8.3 ගෙවූ මුදල ඃ..........................................................................................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.)

09. *අයදුම්කරුගේ සහතිකය ඃ-*

*(අ)* මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්,මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට මම එකඟ වෙමි.

*(ආ)* ම'විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්,පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව මම දනිමි. මා මෙම තනතුරට තෝරා ගැනීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* විභාග ගාස්තු සඳහා වන නියමිත මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවා ඇති බව සහතික කරමි. තවද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් / වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය ඃ...................................... ................................................
අයදුම්කරුගේ අත්සන.

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ......................................................................................... මයා /මිය /මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බව ද, ඔහු /ඇය මා ඉදිරිපිට දී ............................................. වැනි දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

..................................................
සහතික කරන්නාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය ඃ..............................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ..........................................................
තනතුර ඃ..........................................................
ලිපිනය ඃ..........................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

**උපලේඛනය**

එක් එක් දිස්ත්‍රික්කයේ පුරප්පාඩු විෂයයන් මාධ්‍යයය අනුව (✓) ලකුණින් දක්වා ඇත. එම ලකුණින් සඳහන් විෂයයන්ගෙන් පමණක් ඒ ඒ දිස්ත්‍රික්කයේ අදාළ මාධ්‍යයෙන් තෝරාගත යුතු ය.

| *විෂය* | *විෂය අංකය* | *අධ්‍යාපන සුදුසුකම්* | *පුරප්පාඩු* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | *කුරුණෑගල* | | | *පුත්තලම* | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| **ප්‍රාථමික අංශය (1-5)** | | | | | | | | |
| ප්‍රාථමික | 1 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල / දෙමළ භාෂාව හෝ සිංහල / දෙමළ වාග් විද්‍යාව විෂයය හෝ අධ්‍යාපන විෂය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේ දී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය, *හෝ* ඕනෑම ශාස්ත්‍රවේදී උපාධියක් සමග අ.පො.ස. (උසස් පෙළ) සිංහල/දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| විශේෂ අධ්‍යාපනය | 2 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම මනෝ විද්‍යාව / වාග් විද්‍යාව /සිංහල / දෙමළ /දර්ශනය යන ඕනෑම විෂයයක් හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය, *හෝ* විශේෂ අධ්‍යාපන විෂය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| **අ.පො.ස. සා. පෙළ ද්විතීයික අංශය (6-11)** | | | | | | | | |
| ගණිතය | 3 | ගණිතය විෂය සහිත විද්‍යාවේ දී /ව්‍යවහාරික විද්‍යාවේ දී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමඟ අ.පො.ස (උසස් පෙළ) සංයුක්ත ගණිතය/ගණිතය සමත් වී තිබීම, *හෝ* ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස(උසස් පෙළ) සංයුක්ත ගණිතය/ගණිතය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| විද්‍යාව | 4 | ජීව විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව විෂය සහිත විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග උසස් පෙළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව සමත් වී තිබීම,<br>*හෝ*<br>ඕනෑම සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමග අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව විෂයන් සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| සිංහල/දෙමළ (පළමු බස) | 5 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම සිංහල/දෙමළ හෝ සිංහල/දෙමළ වාග් විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| ඉංග්‍රීසි භාෂාව | 6 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය /ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී / තාක්ෂණවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය,<br>*හෝ*<br>ඉංග්‍රීසි විෂය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය. | - | - | ✓ | - | - | ✓ |
| ඉතිහාසය | 7 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉතිහාසය / පුරාවිද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය,<br>*හෝ*<br>විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| භූගෝල විද්‍යාව | 8 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |

| *විෂය* | *විෂය අංකය* | *අධ්‍යාපන සුදුසුකම්* | *පුරප්පාඩු* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | *කුරුණෑගල* | | | *පුත්තලම* | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | 9 | ව්‍යාපාර පරිපාලනවේදී / විද්‍යාවේදී (කළමනාකරණ) / ගණකාධිකරණවේදී / කළමණාකරණවේදී / වාණිජවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය,<br>*හෝ*<br>ප්‍රධාන විෂයක් ලෙස ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ විෂය සහිත ශාස්ත්‍රවේදී / විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| චිත්‍ර | 10 | චිත්‍ර විෂය සහිත ලලිත කලාවේදී / ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමග අ.පො.ස. (උ.පෙළ) චිත්‍ර විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| නර්තනය | 11 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම නර්තනය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ ප්‍රාසාංගික කලාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය,<br>*හෝ*<br>නර්තනය විෂය සහිත ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමඟ අ.පො.ස. (උසස් පෙළ) නර්තනය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. | ✓ | - | - | ✓ | ✓ | - |
| පෙරදිග සංගීතය | 12 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම පෙරදිග සංගීතය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ලලිත කලාවේදී/ප්‍රාසාංගික කලාවේදී/ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| පුරවැසි අධ්‍යාපනය | 13 | සමාජ විද්‍යාව/දේශපාලන විද්‍යාව / භූගෝල විද්‍යාව / ජනසන්නිවේදනය / සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය / ඉතිහාසය / ආර්ථික විද්‍යාව හෝ එම විෂය සංයෝජන සහිත ඕනෑම ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| කෘෂි හා ආහාර තාක්ෂණ-වේදය | 14 | කෘෂිකර්මය/ කෘෂි හා ආහාර තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති විද්‍යාවේ දී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| තොරතුරු තාක්ෂණය | 15 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී / තොරතුරු තාක්ෂණවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය,<br>*හෝ*<br>සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය සමඟ අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා / ගණිත විෂය ධාරාවන් හදාරා විෂයන් 3ක් සමත්ව තිබීම. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 16 | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය / ශාරීරික අධ්‍යාපනය පිළිබඳ විශේෂ උපාධිය,<br>*හෝ*<br>ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| දෙවන බස (දෙමළ) | 17 | දෙමළ මාධ්‍යයය ශාස්ත්‍රවේ දී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස (සිංහල) විෂය හා අ.පො.ස. (උ.පෙළ) දෙමළ විෂය සමත්වීම. | ✓ | - | - | ✓ | - | - |
| දෙවන බස (සිංහල) | 18 | සිංහල මාධ්‍යයය ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ අ.පො.ස. (සා.පෙළ) දෙවන බස (දෙමළ) විෂය සමත්වීම හා අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂය සමත්වීම. | - | ✓ | - | - | ✓ | - |
| පුස්තකාල අධ්‍යාපනය | 19 | පුස්තකාල හා විඥාපන උපාධිය,<br>*හෝ*<br>සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම පුස්තකාල විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය | ✓ | ✓ | - | - | ✓ | - |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| බුද්ධ ධර්මය | 20 | බෞද්ධ දර්ශනය / බෞද්ධ ශිෂ්ටාචාරය / බුද්ධ ධර්මය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| හින්දු ධර්මය | 21 | හින්දු දර්ශනය / හින්දු ශිෂ්ටාචාරය / හින්දු ධර්මය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | - | ✓ | - | - | ✓ | - |
| කතෝලික ධර්මය | 22 | දේව ධර්මය / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය / ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | ✓ | - |
| ඉස්ලාම් ධර්මය | 23 | ඉස්ලාම් දර්ශනය/ඉස්ලාම් ශිෂ්ටාචාරය / ඉස්ලාම් ආගම විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | - | ✓ | - | - | ✓ | - |
| | | **අ.පො.ස. උසස් පෙළ (12-13)** | | | | | | |
| සිංහල/දෙමළ | 24 | සිංහල/දෙමළ හෝ සිංහල/දෙමළ වාග් විද්‍යාව විෂය සහිත ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| ඉංග්‍රීසි භාෂාව | 25 | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළම ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය / ඉංග්‍රීසි වාග් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී / තාක්ෂණවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය,<br>*හෝ*<br>ඉංග්‍රීසි විෂය පිළිබඳ අධ්‍යාපන උපාධිය. | - | - | ✓ | - | - | ✓ |
| දේශපාලන විද්‍යාව | 26 | දේශපාලන විද්‍යාව විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| ඉතිහාසය | 27 | ඉතිහාසය / පුරා විද්‍යාව විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| නාට්‍ය හා රංග කලාව | 28 | නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ ලලිත කලාවේදී / ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| භූගෝල විද්‍යාව | 29 | භූගෝල විද්‍යාව විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| තර්ක ශාස්ත්‍රය | 30 | තර්ක ශාස්ත්‍රය / දර්ශනය විෂයය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| ජන සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 31 | ජනසන්නිවේදනය / සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| ආර්ථික විද්‍යාව | 32 | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| බෞද්ධ ශිෂ්ටාචාරය | 33 | බෞද්ධ දර්ශනය / බෞද්ධ ශිෂ්ටාචාරය / බුද්ධ ධර්මය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| හින්දු ශිෂ්ඨාචාරය | 34 | හින්දු දර්ශනය / හින්දු ධර්මය / හින්දු ශිෂ්ඨාචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | - | ✓ | - | - | ✓ | - |
| ක්‍රිස්තියානි ධර්මය | 35 | ක්‍රිස්තියානි සංස්කෘතිය/ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය / දේව ධර්මය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | ✓ | - |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | 36 | ඉස්ලාම් දර්ශනය / ඉස්ලාම් ශිෂ්ඨාචාරය / ඉස්ලාම් ධර්මය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය. | - | ✓ | - | - | ✓ | - |
| ව්‍යාපාර අධ්‍යයනය | 37 | ව්‍යාපාර අධ්‍යයනය / වාණිජ්‍යය යන විෂයයන්ගෙන් එක් විෂයක් ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති වාණිජවේදී / ව්‍යාපාර පරිපාලනවේදී / විද්‍යාවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | ✓ | - |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| ගිණුම්කරණය | 38 | ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධිය,<br>හෝ<br>ගිණුම්කරණය විෂය සහිත ව්‍යාපාර පරිපාලනවේදී / ව්‍යාපාර කළමනාකරණවේදී/වාණිජවේදී විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| කෘෂිවිද්‍යාව | 39 | කෘෂිවිද්‍යාව / කෘෂි තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | - | - |
| සංයුක්ත ගණිතය | 40 | ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය/උසස් ගණිතය විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| භෞතික විද්‍යාව | 41 | භෞතික විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| ජීව විද්‍යාව | 42 | ජීව විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| රසායන විද්‍යාව | 43 | රසායන විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී / ව්‍යවහාරික විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | ✓ | - | ✓ | ✓ | - |
| තාක්ෂණය සඳහා විද්‍යාව | 44 | භෞතික විද්‍යාව විෂය සහිත විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| ජෛව පද්ධති තාක්ෂණ වේදය | 45 | ජෛව පද්ධති / කෘෂි හා ආහාර තාක්ෂණය / පරිසර විද්‍යාව / කෘෂි විද්‍යාව / ඛනිජ සම්පත් තාක්ෂණය විෂය සංයෝග සහිත විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය. | ✓ | - | - | ✓ | - | - |
| ඉංජිනේරු තාක්ෂණ වේදය | 46 | ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය / ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය / නීති විද්‍යා තාක්ෂණවේදය (නැනෝ තාක්ෂණය) පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ උපාධිය / විද්‍යාවේදී (මැනුම් විද්‍යාව) උපාධිය / තාක්ෂණවේදය (විද්‍යාව හා තාක්ෂණය) පිළිබඳ උපාධියක් හෝ මතු දැක්වෙන සුදුසුකමක් - | ✓ | - | - | ✓ | - | - |

| විෂය | විෂය අංකය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | කුරුණෑගල | | | පුත්තලම | | |
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| | | සිවිල් යාන්ත්‍රික / විදුලිය හා ඉලෙක්ට්‍රෝන තාක්ෂණයට අදාළ තාක්ෂණවේදී උපාධිය,<br><br>හෝ<br><br>ඕනෑම උපාධියක් සමග අ.පො.ස. (උ/පෙළ) ගණිතය / ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා අවම වශයෙන් විෂයයන් තුන සමත් වීම,<br>හෝ<br><br>ඕනෑම උපාධියක් සමඟ ඉංජිනේරු තාක්ෂණවේදය (සිවිල්/යාන්ත්‍රික/විදුලිය හා ඉලෙක්ට්‍රෝන) ක්ෂේත්‍රයේ NVQ -5 මට්ටමේ හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම. | ✓ | - | - | ✓ | - | - |

12-522/5

---

## සංශෝධනයයි

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - 1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළව 2018.11.23 දින අංක 2099 දරණ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදන අංක 11-1007 හා බැඳේ.

02. උක්ත නිවේදනයේ 2.2 උප ඡේදයෙහි අධ්‍යාපන සුදුසුකම් යටතේ ඇති (2) III වගන්තිය පහත සඳහන් ආකාරයට සංශෝධනය කර ඇත.

(2) III. අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එක් වරකදී විෂයයන් තුනක් (03) සඳහා සාමාර්ථ ලබා තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයට විශිෂ්ට සාමාර්ථයක් හෝ අධි සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

12-522/6

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.